277

අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අංශය
සිංහල භාෂා ඒකකය

# සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023
## පළාත් මට්ටම

01. අපේක්ෂකයාගේ නම : ..........................................................................................................
    (මුල්කුරු සමග නිවැරදි ව ලියන්න)

02. විදුහලේ නම සහ ලිපිනය : ...............................................................................................

03. පාසල් වර්ගය : 200ට අඩු / 201-500 තෙක් /500ට වැඩි

04. කලාපය : ...................................................................................

05. පළාත : ........................................................................................

---

## භාෂා භාවිතය හා අවබෝධය

**9 ශ්‍රේණිය** **කාලය : පැය 02යි.**

**I , II කොටස්වල ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

### I වැනි කොටස

1. **අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

(i) ආශ්වාදය / ආස්වාදය / ආෂ්වාදය
(ii) ෙඖෂධ / ඖෂද / ඖෂධ
(iii) නිෂ්ඵල / නිශ්ඵල / නිෂ්පල
(iv) විශිෂ්ඨ / විෂිශ්ඨ / විශිෂ්ට
(v) සන්දර්ශන / සංදර්ෂන / සන්දර්ශණ
(vi) අබිබවා / අභිබවා /අබිභවා
(vii) කොට්ඨාෂය / කොට්ඨාසය / කොට්ටාසය
(viii) එළවලු / එලවළු /එළවළු
(ix) කනිෂ්ඨ / කණිෂ්ට / කනිෂ්ට
(x) නිශ්චළ / නිශ්චල / නිෂ්චල

(ලකුණු 1 x 10 = 10 යි)

2. **පහත පදවල අර්ථය ලියන්න.**

(i) ධූර්තයෝ - ..............................................................................................
(ii) උරුමය - ..............................................................................................
(iii) මුකුලිත - ..............................................................................................
(iv) පරිචය - ..............................................................................................
(v) ශක්‍යතාව - ..............................................................................................

(ලකුණු 1 x 5 = 5 යි)

3. **හිස්තැනට යෝග්‍ය පද යොදා පහත සඳහන් රූඩී හා ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.**

(i) වෙහෙර ගිලපු යකාට ..........................................................................
(ii) .......................................................................... අත පුච්චා ගත්තා වගෙයි.

(iii) තැනේ හැටියට ..............................................................................................................

(iv) .................................................................................... කෑ උගුඩුවා වගෙයි.

(v) ....................................................................................... පෙට්ටියට දැමීම.

(ලකුණු 1 x 5 = 05 යි)

4. පහත දැක්වෙන පදවල ප්‍රකෘතිය ලියා දක්වන්න.

(i) මිනිසා - ..........................................................................................................

(ii) වනිතාව - ..........................................................................................................

(iii) ගොවියෝ - ..........................................................................................................

(iv) ගයති - ..........................................................................................................

(v) පුටුව - ..........................................................................................................

(ලකුණු 1 x 5 = 05 යි)

5. පහත දැක්වෙන පද අයත් වන ව්‍යාකරණ වර්ගය කුමක් දැ'යි ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

(i) අනේ - ..........................................................................................................

(ii) දුව දුවා - ..........................................................................................................

(iii) ඇතමෙක් - ..........................................................................................................

(iv) මිනිසුන් - ..........................................................................................................

(v) සතුටින් - ..........................................................................................................

(ලකුණු 1 x 5 = 05 යි)

6. පහත සඳහන් පදවලට සමානාර්ථවත් පදයක් හා විරුද්ධාර්ථවත් පදයක් ඉදිරියෙන් ඇති තිත් ඉරි මත ලියන්න.

| | සමානාර්ථවත් පදය | විරුද්ධාර්ථවත් පදය |
|---|---|---|
| (i) ජය | ...................................................... | ...................................................... |
| (ii) උත්තම | ...................................................... | ...................................................... |
| (iii) පහසු | ...................................................... | ...................................................... |
| (iv) උත්කෘෂ්ට | ...................................................... | ...................................................... |
| (v) තැත | ...................................................... | ...................................................... |

(ලකුණු 1 x 10 = 10 යි)

7. (අ) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) මම පොතක් කියවමි ..........................................................................................

(ii) ඔබ මා කැඳෙව්වෙහි ..........................................................................................

(iii) භික්ෂූහු දහම් දෙසති ..........................................................................................

(iv) සේවකයෝ වැඩවර්ජනය කළහ ..........................................................................................

(v) ආදි ශිෂ්‍ය සංගමය ක්‍රිකට් රනින් පිදිය ..........................................................................................

..........................................................................................................................................

CS CamScanner

(ආ) පහත දැක්වෙන කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.

(i) මා විසින් ගීයක් ලියනු ලැබී ය.

.......................................................................................................................

(ii) අප විසින් ගුණ දහම් පුරනු ලැබිණි.

.......................................................................................................................

(iii) දෙමව්පියන් විසින් පාසල පිරිසිදු කෙරිණි.

.......................................................................................................................

(iv) පාලකයන් විසින් සේවකයෝ ඇගයෙති.

.......................................................................................................................

(v) සංවිධායකයන් විසින් අපි පිළිගනු ලැබුමු.

.......................................................................................................................

(ලකුණු 1 x 5 = 5 යි)

8. පහත සඳහන් වාක්‍ය නිවැරදි කර ලියන්න.

(i) ගුරුවරු ශිෂ්‍යයෝ සමග චාරිකාවේ යෙදෙති.

.......................................................................................................................

(ii) තාරකාවෝ අහස්තලයේ නෙක රටා මවයි.

.......................................................................................................................

(iii) එක් කෙනෙක් සහා ගර්භයෙන් පිට වූහ.

.......................................................................................................................

(iv) ඔහු ද අම්මා ද මම ද භාවනා වැඩසටහනකට සහභාගි වෙති.

.......................................................................................................................

(v) මිනිසෙක් දරුවෙක් කැටුව දිය නෑමට යයි.

.......................................................................................................................

(ලකුණු 2 x 5 = 10 යි)

## II කොටස

9. පහත පැදිපෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මේ ගැබකින් පබ දැ
නිකුත් සඳ මඩලක් ලෙ දැ
මවු කුසයෙන් පැහැ දැ
පහන් ලොව දිටි කුමර මනන දැ

තවර කර ගත දිලිඟු රැ
විකර වෙස් ගෙන විසිතු රැ
එපුර දොර දොර තිරතු රැ
පැතිර රඟ දෙති සමහ රැ

සොවගින් තැවෙමින් හිමි සඳ එ දිගැස
ඇය තත් සිල් ගුණ මහිමෙන් එ විගස
සුරිඳුන් පඬුපුල් සලසුන් සිසිලස
නොමදින් හුරු විය රත් යවටක් ලෙස



Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more! CamScanner

(i) මෙහි දැක්වෙන කුමර උපත උපමා කෙරෙන්නේ කුමකට ද?

..................................................................................................

(ii) සමහරු රඟ දීමට සැරසුණේ කෙසේ ද?

..................................................................................................

(iii) "සුරිඳුන් පඬුපුල් සලසුන් සිසිලස" යන පද්‍ය පාදයේ අදහස ලියන්න.

..................................................................................................

(iv) මෙහි සඳහන් කාව්‍යාලංකාරයක් උදාහරණ සහිත ව ලියන්න.

..................................................................................................

(v) පහත පදවල අර්ථය ලියන්න.

(අ) දිගැස ..................................................................................

(ආ) යවටක් ..................................................................................

(ලකුණු 4 x 5 = 20 යි)

10. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පෘථිවිය මතුපිට අධික ලෙස වර්ෂාව ලැබීමෙන් වනාන්තර ප්‍රදේශ ද වර්ෂාව නොලැබීමේ හේතුවෙන් වෘක්ෂලතාදිය නොවැවෙන කාන්තාර ප්‍රදේශ ද ඇති වේ. එහෙත් ස්වභාවයෙන් ම මේ එක් ප්‍රදේශයක් අනික් ප්‍රදේශයෙකින් පැහැදිලි ලෙස වෙන් ව පිහිටා නැත. අධික ලෙස වර්ෂාව ලැබෙන වනාන්තර ප්‍රදේශයක් සෙමෙන් සෙමෙන් දීර්ඝ ව වර්ෂාව නොලබන කාන්තාර ප්‍රදේශයක් බවට පෙරළීමේ දී ඒ අතර තෘණතලා අවස්ථාවක් දක්නට ලැබේ. විශාල වෘක්ෂ වර්ධනය වී වනාන්තර දක්වන අතර තෘණභූමි, තණ පඳුරු හෝ එවැනි අන් පැළෑටීන්ගෙන් ගහණ වෙයි. මෙනයින් වනාන්තර, තණබිම්, කාන්තාර යැයි ප්‍රධාන වෘක්ෂලතා කලාප තුනක් ඇති විය යුතු සේ පෙනේ. ඝර්ම කලාපයන්හි ද වන කලාපය, තණබිමක් වන තුරු දීර්ඝ වන විට ඒ අතර පිහිටි ප්‍රදේශය තන්හි තන්හි වැඩුණ වෘක්ෂ ඇති තණ පිට්ටනි සහිත උයන් බිමක් වැනි ප්‍රදේශයක් දක්වයි. සෞම්‍ය කලාපික අක්ෂාංශකයන්හි දී ද මේ වෙනස් කලාප දක්නා ලැබේ. සාමාන්‍යයෙන් තෘණභූමිය හා කාන්තාරය අතර ප්‍රදේශය ඉතා මිටි පඳුරු තුනී ලෙස විහිදි පෙදෙසකි. මෙය ළඳු බිම යන නමින් හැඳින්වේ.

(i) වනාන්තර ප්‍රදේශ හා කාන්තාර ප්‍රදේශ ඇතිවන්නේ කෙසේ ද?

..................................................................................................

..................................................................................................

(ii) තෘණතලා අවස්ථාවක් දක්කට ලැබෙන්නේ කිනම් කාලයක දී ද?

..................................................................................................

..................................................................................................

(iii) උයන් බිම් වැනි ප්‍රදේශ ඇත්තේ කුමන කලාපයන්හි ද?

..................................................................................................

..................................................................................................

(iv) 'ළඳු බිම්' යනු මොනවා ද ?

..................................................................................................

..................................................................................................

(v) මෙහි දැක්වෙන ප්‍රධාන වෘක්ෂලතා කලාප තුන සඳහන් කරන්න.

1. ..................................................................................

2. ..................................................................................

3. ..................................................................................

(ලකුණු 4 x 5 = 20 යි)

PAST PAPERS WIKI



CamScanner